2016 . 07 . 08

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2016

**සිංහල භාෂාව හා සාහිත්‍යය** **8 ශ්‍රේණිය**

විභාග අංකය :............................................ **කාලය පැය 02 යි**

## I කොටස

❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

* පහත වාක්‍යයන්හි ඉරි ඇඳි පදවල අදහසට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1). I. පුතු වෙනුවෙනි පැණි පිරුණේ
පුතුගෙ <u>හිසේ මල්</u> <u>පිපුණේ</u>

1. දැඩි සතුටක් ඇති වීම.
2. දැඩි දුකක් ඇති වීම.
3. පුතාගේ හිසේ මලක් පිපීම.
4. දැඩි කරදරයක් ඇති වීම.

(2). I. මන්ත්‍රීතුමා පැමිණි විට එතැන <u>කලබගෑනියක්</u> ඇති විය.

1. කරදරයක් 2. ආරවුලක්
3. පිළිගැනීමක් 4. ප්‍රතික්ෂේප වීමක්.

* හිස්තැනට ගැළපෙන අර්ථය සහිත පදය තෝරන්න.

(3). I. ශ්‍රී දළදා වහන්සේ දෙස් විදෙස් බැතිමතුන්ගේ විශේෂිත ගෞරව ............................... පාත්‍ර වේ.

1. පරිණාමයට 2. ප්‍රණාමයට 3. පිරිහීමට 4. පිළිගැනීමට

II. සිංහල භාෂා සාහිත්‍යයේ ............................... සඳහා මුනිදාස කුමාරතුංගයන්ගෙන් සිදු වූ සේවය විශිෂ්ට ය.

1. පෝෂණය 2. ප්‍රවෘත්තිය 3. ප්‍රණාමය 4. ප්‍රදර්ශනය

* පහත සඳහන් කවි දෙ පදයේ හා ගද්‍ය පාඨයේ ඇති සඤ්ඤක අක්ෂර සහිත පද තෝරා හිස්තැන මත ලියන්න.

(4). I. මලින් මලේ රොන් ගන්නා බඹරු දුවන්නා
රළින් රළේ මොනරුන් ඉද පිල් විදහන්නා

* ..........................................................................

* ..........................................................................

II. මම දන්නේ නෑ කුවේණි උඹලගෙ කවුද කියල. ඒත් ඒ කිව්වෙ කුවේණි ගැන තමා මගේ ඇගේ මයිල් කෙලින් හිටිනවා.

* ..........................................................................

* ..........................................................................

* සියලුම පදවල අක්ෂර වින්‍යාසය නිවැරදි පද පේළිය තෝරන්න.

(5). I. 1. අපේක්ෂිත , ප්‍රතිඵල , පර්යේෂන , ප්‍රකාශ

2. අවබෝධය , සියොළඟ , රාශි චක්‍රය , අධ්‍යක්ශ

3. පිළියෙල , පරිගෘහිත , සංස්කෘතිය , අනන්‍යතාව

4. සද්ධර්මය , ගන්දකුටිය , ප්‍රවිෂ්ට , භාග්‍ය

II. 1. පෞරුෂය , බුද්ධිමත් , විස්මය , කාර්යාලය

2. අවධානය , ශිෂ්ටාචාරය , ඓතිහාසික , විශ්වාස

3. දුරකථනය , ප්‍රේක්ෂකාගාරය , ප්‍රතිමාව , විෂේශ

4. පරිගණකය , ව්‍යාප්ත , ජ්‍යේෂ්ට , සංවර්ධනය

* හිස්තැනට සුදුසු අක්ෂරය වරහන් තුළින් තෝරා ලියන්න.

(6). 1. ආහර ............ (ණ - න)

2. පුස්තකා ............ය (ළ - ල)

3. වර් ............ ය (ශ - ෂ)

4. මස් ........... කය (ථ - ත)

* හිස්තැනට සුදුසු ආඛ්‍යාත පද යොදා සම්පූර්ණ කරන්න.

(7). I. කාන්තාවෝ වල් පැළ නෙළීමට කුඹුරට ............................................ (ගියේය - ගියහ.)

II. වනයේ මල් වල සුවඳ දසත ............................................ (පැතිරෙයි - පැතිරෙති)

* පහත සඳහන් වාක්‍ය අනතීත කාලයට හරවා ලියන්න.

(8). I. නැන්දා ගෙදරට අවුත් ආහාර බෙදා දුන්නා ය.

..........................................................................................

II. ජාතික ගීය ගායනා කරන විට සියල්ලෝ ම සිය අසුන්වලින් නැගිට සිටිය හ.

..........................................................................................

..........................................................................................

* හිස්තැනට සුදුසු උක්ත පද වරහන් තුළින් තෝරා සම්පූර්ණ කරන්න.

(9). I. ........................................ සති පොළෙහි බඩු විකුණයි. (වෙළෙන්දෝ - වෙළෙන්දා)

II. ........................................ නගරයෙන් පැමිණි අය වෙති. ( ඔවුහු - ඔහු)

* පහත ඉරි ඇඳි පද අයත් ක්‍රියා වර්ගය වරහන් තුළින් තෝරන්න.

(10). I. <u>අඳිමින්</u> සුදු සේලේ රැලි අල්ලා (මිශ්‍ර ක්‍රියා - පූර්ව ක්‍රියා)

II. ගැමියා ගැමි කාන්තාව ලවා රබන් <u>වයවයි</u>. (පූර්ව ක්‍රියා - ප්‍රයෝජ්‍ය ක්‍රියා)

* පහත සඳහන් වාක්‍යවල නිවැරදිව විරාම ලකුණු යොදා ඇති වාක්‍ය තෝරන්න.

(11). 1. පෙත්තෝ බත් කෑව ද !

2. 'භාෂාව' ගැන විශේෂයෙන් කතා බහ කරන්නේ ඇයි ද යි කෙනෙකුට සිතෙයි

3. සතුන් තුළ මේ තත්ත්වය, දැකිය නොහැකි ද ?

4. ''මොකද අනේ මේ නාකි හුරතල් ?''

REFERENCE ONLY

* දී ඇති අදහසට ගැළපෙන තනි පද ලියන්න.

(12). I. ඇති තත්ත්වයට වඩා වැඩියෙන් කීම.

.............................................................................................................

II. බොහෝ කාලයක සිට පැවත එන

.............................................................................................................

* පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

(13). I. කුඤ්ඤය ගැළ වූ .............................................................................................

II. ............................................................................ බුරුවා බාර ගත්තා වාගේ.

* පහත දී ඇති වාක්‍යවල උපමාව හා උපමේය වෙන් කර ලියන්න.

(14). I. සීයාගේ හිස කපු පුළුන් මලක් වැනිය.

* උපමාව - .............................................................................

* උපමේය - .............................................................................

II. කාන්තාවගේ කෙස් කළඹ මොනර පිලක් මෙන් දිස් විය.

* උපමාව - .............................................................................

* උපමේය - .............................................................................

* පහත දී ඇති වාක්‍යවල සඳහන් යුගල පද තෝරා ලියන්න.

(15). I. සිදු වුණ දේට හඬා දොඩා පලක් නොවන බව ඔවුන්ගේ අදහසයි.

.............................................................................................................

II. සමිති සමාගම්වල වැඩ බහුල බැවින් පොඩි රාළහාමි මඟුල් ගෙදරට සහභාගී නොවී ය.

.............................................................................................................

* පහත දී ඇති වාක්‍යවල සඳහන් ද්‍රව්‍ය නාම හා ජාති නාම පද තෝරා ලියන්න.

(16). මිනිසා ගඩොල් උපයෝගී කර ගෙන වටිනා නිර්මාණ බිහි කරයි.

I. ජාති නාම - .............................................................................

II. ද්‍රව්‍ය නාම - .............................................................................

* සඳ යන පදය යොදා අර්ථවත් වාක්‍ය දෙකක් ලියන්න.

(17). I. .............................................................................................................

II. .............................................................................................................

* පහත සඳහන් පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කර ලියන්න.

| | | ප්‍රකෘතිය | | ප්‍රත්‍යය |
|---|---|---|---|---|
| (18). I. | වඳුරා → | ................................ | + | ................................ |
| II. | ගැමියෝ → | ................................ | + | ................................ |

* පහත දී ඇති වාක්‍යයේ ඉරි ඇඳි පදවලට ගැළපෙන විරුද්ධ පදය යොදා නැවත ලියන්න.

(19). I. සරල ගණිත ක්‍රම භාවිත කරමින් ගණන් සියල්ල ම නිවැරදිව සෑදීමට නිමල්ට හැකිවිය.

.............................................................................................................................................

.............................................................................................................................................

II. කෘත්‍රිම ආහාර පරිභෝජනය නිරෝගී දිවියට බාධාවකි.

.............................................................................................................................................

.............................................................................................................................................

* මධ්‍යම පුරුෂ ඒක වචන ආඛ්‍යාත පදය තෝරන්න.

(20). I. 1. කැවෙහු 2. කැවෙමි 3. කැවෙහි 4. කැවෙමු.

* ප්‍රථම පුරුෂ බහු වචන අතීත කාල ආඛ්‍යාතය තෝරන්න.

II. 1. නැටුවෙමි 2. නැටුවාය 3. නටති. 4. නැටූහ.

(ලකුණු 1 X 20=20)

## II කොටස

* පළමු හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. ඔබගේ පන්ති කාමරය තුළ ඉටු කළ ඇගයීම ඇසුරින් පිළිතුරු සපයන්න.

1). පංති කාමරයේ දී ඔබ ඇගයීමක් ලෙස කරන ලද නිර්මාණාත්මක ක්‍රියාකාරකම කුමක් ද ?

2). මෙය කණ්ඩායම් ක්‍රියාකාරකම් ලෙස කිරීමට සැලසුම් කරන ලද්දේ කෙසේ ද ?

3). මෙම නිර්මාණාත්මක ක්‍රියාකාරකම තුළින් ලැබූ වාසි දෙකක් ලියන්න.

4). මෙය ඉටු කිරීමේදී ඇති වූ ගැටලු දෙකක් ලියන්න.

5). මෙවැනි ඇගයීම් ඉටු කිරීම සම්බන්ධව ඔබගේ අදහස කෙටියෙන් ලියන්න.

(ලකුණු 10)

02. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 200 කට නොඅඩු රචනයක් ලියන්න.

1). මා සිත් ගත් ලේඛකයා

2). මා දුටු ගංවතුර උවදුර

3). අපේ ජනකෙළි

4). උගත මනා ශිල්පයමයි මතු රැකෙනා.

(ලකුණු 20)

03. ඔබ පාසලේ පැවැත්වීමට යෝජිත සිසු පොළ සඳහා අවසර ඉල්ලමින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට යවන ලිපිය ලියන්න. ඔබ සිසු පොළ සංවිධායක මණ්ඩලයේ ලේකම් යැයි සිතන්න.

(ලකුණු 10)

04. පහත සඳහන් ගද්‍ය පද්‍ය කොටස් කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

I. මළ බිසොවුන් ගෙන් පෙරාතු උපන් පුත් දෙබෑයෝ තේජසින් ගිනි කඳ පරිද්දෙන් බබළති. එසේ හෙයින් තොපගේ පුතණුවන්ට රාජ්‍ය දෙන්ට බැරි ය.

1. මෙම කොටසට අදාළව රාජ්‍ය දීමට නොහැකි බව පැවසුවේ කා හටද ?

2. මෙහි ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

සිංහල
8 ශ්‍රේණිය

REFERENCE ONLY

II. කලගෙඩි පිඹිනා බාල ළඳුන්නේ
බල සොඳ රුසිරු රන්ලිය වැන්නේ
නළල ද දිලිසෙන අඩ සඳ වැන්නේ
බලන්න සොඳ රුව පියොබඳ උන්නේ

1. මෙහි සඳහන් පරිදි කලගෙඩි පිඹින්නේ කවුරුන් ද ?
2. ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ලකුණු = 10)

05. පෙළ පොත ඇසුරින් පිළිතුරු ලියන්න.

1. ලෝකයේ පුදුම හතෙන් දෙකක් ලියන්න.
2. එතෙර මෙතෙර පාඩම උපුටා ගත් මුල් කෘතිය කුමක් ද ?
3. කුවේණි නාට්‍යයේ දරු දෙදෙනාගේ නම් ලියන්න.
4. දන්ත ධාතුන් වහන්සේ තැන්පත් කර ඇති රන් කරඬුව පරිත්‍යාග කළේ කුමන රටෙන් ද ?
5. අරිසෙන් අහුබුදු ගුරුන්ගේ කෘති දෙකක නම් ලියන්න.

(ලකුණු = 10)

06. පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

පුන්සඳ මඬල වැඩෙන සඳ අහස පිට
දිලිහෙයි මදින් මඳ තරුවැල් ක්‍ෂණක කැට
වවුලෝ පිය හඹා යෙති අඹ උයන සිට
සඳරැස් වැටෙයි කවුළුවෙකින් නිදන ගෙට

1. මෙම කවියෙන් කියැවෙන්නේ දවසේ කුමන වේලාවක් පිළිබඳව ද ?
2. මෙහි තරුවැල් උපමා කර ඇත්තේ කුමකට ද ?
3. අඹ උයනට පැමිණියෝ කවුරුන් ද ?
4. නිදන ගෙට සඳරැස් වැටෙන්නේ කුමකින් ද ?
5. පහත වචනවලට සමාන පද ලියන්න.
   * පුන් සඳ
   * කවුළුව

(ලකුණු = 10)

07. පහත සඳහන් දෙබස් කා විසින් කා හට කියන ලද්දක් දැයි ලියන්න.

1. කට කැඩෙනකම් කිව්වත් වැඩක් තියෙනවායැ
2. තෙපි නුවණැති හෙයින් දේව ධර්මය දනුව.
3. ඊයෙ රාත්‍රියේ බිංදුවක්වත් ඇහැ පිය වෙලා නෑ නොවැ
4. ඔහොම කැවොත් කාලා තියෙයි.
5. "අප්පච්චියේ තියෙන සතුට " යි පැවසූ ...............

(ලකුණු 2 x 5 = 10)